වලපනේ ප්‍රාදේශීය සභාව
නුවරඑළිය දිස්ත්‍රික්කය

-----------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 12 දිනද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 මැයි 29 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට වලපනේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ මුළු ප්‍රාග්ධන වියදම රු.25,007,161 ක් වුවද එම වටිනාකම රු.21,730,101 ක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ මිලදීගෙන තිබුණු රු.2,386,246 ක් වටිනා යන්ත්‍ර උපකරණ, ලී බඩු හා සවිකිරීම් සහ කාර්යාල උපකරණ, සැපයුම් හා උපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ අක්කර බදු ආදායම වූ රු.49,256 ක් ආදායම් වියදම් ගිණුමට බැර කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iv) | 2015 වර්ෂයේ නිමකරන ලද ඉදිකිරීම් කර්මාන්ත 06 ක් සඳහා ගෙවිය යුතු රු.149,890 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ලැබිය යුතු ශේෂයන් ලෙසට දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි |
| (v) | 2016 වර්ෂයේදී නිකුත් කළ රු.537,877 ක් වටිනා කොම්පෝස්ට් බඳුන් 190 ක් කාර්යාල උපකරණ යටතේ ගිණුම්ගත කිරීම නිවැරදි කිරීමේදී ප්‍රාග්ධන | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| | යෙදවුමට ආදායමින් දායක වීමේ ගිණුම වෙනුවට සමුච්චිත අරමුදල් ගිණුම හර කර තිබුණි. | | |
| (vi) | පූර්ව වර්ෂයන්හිදී ගබඩා වලින් ඉවත්කර තිබුණු රු.1,814,164 ක් ගිණුම්වලින් ඉවත් කිරීමේදි සමුච්චිත අරමුදලට හර කළ යුතු වුවත්, ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමට හර කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (vii) | 2017 වර්ෂයේදී නිමකරන ලද ඉදිකිරීම් කර්මාන්ත දෙකකට අදාළව ගිණුම්ගත කර නොතිබුණු ලැබිය යුතු මූලධන ආධාර රු.290,000 ක් ජ'නල් අංක 39 මගින් රු.580,000 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ගිණුම් තැබීම නිවැරදිව කළ යුතුවේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ආ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම

---------------------------------------------------

තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

-----------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| යාවත්කාලීන කරන ලද තැන්පතු ලේඛන ඉදිරිපත් නොකිරීම නිසා රු.1,428,831 ක් වූ තැන්පතු ශේෂ 04ක් විගනනයේදි සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරිමට නොහැකි විය. | මුලා‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | 2013 වර්ෂයට පසු ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යන අතර 2013 ට පෙර ශේෂ සොයා බලා නිවැරදි කිරිමට කටයුතු කරමි. |

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

--------------------------------------------

(i) ලැබිය යුතු ගිණුම්

---------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට වසරක කාලයක් ඉක්මවූ ලැබිය යුතු ගිණුම් ශේෂවල එකතුව රු.1,688,058 ක් විය. | ලැබිය යුතු ශේෂ අයකරගැනීමට සහ සාවද්‍ය ශේෂ පවතින්නේ නම් සොයාබලා නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | එම මුදල් අයකර ගැනීමටත් 2019.12.31 දිනට පෙර නිරවුල් කිරීමටත් කටයුතු කරමි. |

(ii) ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්සය අවසානයට වසරක කාලයක් ඉක්මවූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල එකතුව රු.7,518,946 ක් විය. | ගෙවිය යුතු ශේෂ ගෙවා නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරන අතර කර්මාන්ත සඳහා මුදල් ලැබෙන ආකාරයට ගෙවීම් සිදුකරමි. |

1.4 අනුකූල නොවීම්

1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති ,රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | <u>ප්‍රාදේශීය සභා පනත</u> 126 (III) උපවගන්තිය | සභා බල ප්‍රදේශයේ පවතින දුරකථන සම්ප්‍රේෂණ කුළුනුවලින් අතුරු ව්‍යවස්ථා පනවා ආදායමක් ලබාගැනීමට සහ අනෙකුත් අවශ්‍ය විධිවිධාන පැනවීමට ඇති හැකියාව කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂය තුලදී ආදායම් අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | ආයතන සංග්‍රහය XXIV පරිච්ඡේදයේ 4 වන වගන්තිය | සභාවේ සේවය කර සේවය හැරගිය, විශ්‍රාම ලැබූ හා මියගිය නිලධාරින්/ සේවකයින් 12 දෙනෙකුගෙන් 2018.12.31 දින වන විට අයවිය යුතුව තිබුණු ණය ශේෂය රු. 134,595 ක් විය. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කර ණය මුදල් අයකර ගත යුතුවේ. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාව සතු වාහන 08 ක චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂා කර නොතිබුණි | චක්‍රලේඛයේ උපදෙස් අනුව ඉන්ධන දහන පරීක්ෂාව සිදුකළ යුතුවේ. | කඩිනමින් ඉන්ධන දහන පරීක්ෂාවක් සිදු කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | සභා බල ප්‍රදේශයේ වරිපනම් දේපල 2011 වර්ෂයට පසු තක්සේරුකර නොතිබුණි | චක්‍රලේඛයේ දැක්වෙන ආකාරයට වරිපනම් බදු තක්සේරු කළ යුතුවේ. | තක්සේරු දෙපාර්තමේන්තුවට දන්වා ඇති අතර නැවත දැනුම් දෙමි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,776,520 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.6,962,980 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,004,754 | 2,024,849 | 1,423,662 | 1,688,108 | 2,312,974 | 2,449,170 | 1,851,807 | 1,517,888 |
| කුලී | 5,896,410 | 4,949,690 | 4,424,978 | 3,487,067 | 6,128,000 | 4,617,855 | 3,976,260 | 3,142,146 |
| බලපත්‍ර ගාස්තු | 3,615,000 | 3,487,058 | 3,487,058 | - | 3,404,000 | 3,588,348 | 3,588,348 | - |
| වෙනත් ආදායම් | 7,197,639 | 5,279,508 | 5,235,658 | 224,895 | 6,491,000 | 7,306,295 | 4,659,530 | 3,549,712 |
| | 18,713,803 | 15,741,105 | 14,571,356 | 224,895 | 18,335,974 | 17,961,668 | 14,075,945 | 8,209,746 |

2.2.2 කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව සතු කඩ කාමර බදුගෙන තිබුණු බදුකරුවන් 05 දෙනෙකු මාස 12 සිට මාස 71 දක්වා කාල පරාසයක සිට බදුකුලී ගෙවීම පැහැර හැර තිබුණු අතර 2018 දෙසැම්බර් 31 දිනට එම හිඟය රු.691,060ක් විය. . | ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර හිඟ මුදල් අයකර ගත යුතු වේ. | කඩ කාමර සන්තකය පවරා ගැනීම සඳහා සභාව වෙත හිමිකම් ඔප්පු නොමැති අතර 2018 වර්ෂය තුල ආදායම් පරික්ෂකවරයෙකු නොමැති වීමත් ආදායම් අයකිරිම දුර්වල වීමට බලපාන ලදී.කෙසේ වෙතත් හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කර විගණනය වෙත වාර්තා කරමි. |

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

(අ) උසාවි දඩ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.226,117 ක උසාවි දඩ හා රු.3,529,900 ක මුද්දර ගාස්තු ශේෂයක් විය. | අදාළ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අයකරගැනීමට කටයුතු කරමි. |

2.3.4 අධිභාර

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු අයවලුන්ට එරෙහිව මවිසින් ඉකුත් වර්ෂයන් තුළ පැනවූ අධිභාරවලින් 2018 දෙසැම්බර් 31 දිනට රු. 29,975 ක මුදලක් අයකර ගැනීමට තිබුණි. | මුදල් අයකරවා ගැනීමට කටයුතු කළ යුතුවේ. | මේ සම්බන්ධයෙන් සොයාබලා අයකර ගැනීමට කටයුතු කරමි. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1. කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කාර්තවයන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දඹේකැලේ කසල කළමනාකරණ මධ්‍යස්ථානයේ විධිමත් කසළ කළමනාකරණ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. | කසළ වර්ගීකරණය කර ලබාගෙන නිසි පරිදි කළමනාකරණය කළ යුතුවේ. | පිළිසරු ව්‍යාපෘතිය යටතේ කොම්පොස්ට් අංගනය වැඩිදියුණු කරගෙන යනු ලබන අතර මෙම ගැටළු 2019 වර්ෂය තුළ මග හරවා ගැනීමට කටයුතු කරමි. |

(ආ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක පිළිබඳව ප්‍රාදේශීය සභාව ප්‍රමාණවත්ව දැනුවත්වී නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය තුලදී ඒ සම්බන්ධයෙන් නිශ්චිත කාර්යයන් ඉටුකර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක සපුරා ගැනීමට සැලසුම් සකස් කළ යුතුවේ. | මේ සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකිරීමට කටයුතු කරමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) වලපනේ පොදු වෙළඳපලේ පිහිටි කඩ කාමර 16ක් සඳහා තක්සේරු දෙපාර්තුමේන්තුව විසින් 2017.01.01 සිට බල පැවැත්වෙන පරිදි නව තක්සේරුවක් ඉදිරිපත් කර තිබුණු නමුත් සභාව විසින් නව තක්සේරුව 2019.01.01 දින සිට ක්‍රියාත්මක කිරීමට තීරණය කර තිබීම හේතුවෙන් සභා අරමුදලට ලැබිය යුතු රු.572,400 ක ආදායමක් අහිමිව තිබුණි. | නව තක්සේරුව අනුව කඩකුලී අයකර ගත යුතුවේ. | තක්සේරු වාර්තාව ලැබෙන විට 2017 හා 2018 වර්ෂවල බිල්කිරීම් කර තිබීම හා බදුකරුවන් සමඟ ගිවිසුම් වලට එළඹීමේ අපහසුව මත 2019.01.01 සිට තක්සේරුව ක්‍රියාත්මක කිරීමට සභාව අනුමත කර ඇත. ඒ අනුව තක්සේරුව 2019.01.01 සිට බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක නිරීමට සංශෝධනය කර ලෙද ලෙස තක්සේරු දෙපාර්තමේන්තුවට දන්වා ඇත. |
| (ආ) සභාව සතු කැබ් රථයක් සඳහා 2007 පෙබරවාරි 07 දින සිට 2018 දෙසැම්බර් 23 දක්වා වූ අවුරුදු 11ක් ආදායම් බලපත්‍ර ලබා නොගැනීම හේතුවෙන් රු.25,545 ක දඩ මුදලක්ද ගෙවා තිබුණද කැබ් රථය භාවිතයට නොගෙන සභා පරිශ්‍රය තුළ ගාල්කර තිබුණි. | අදාළ කැබ් රථය භාවිතා කිරීමට කටයුතු කළ යුතුවේ. | මෙම වාහන ධාවන තත්ත්වයේ පවතින අතර වසර 05කට වඩා ආදායම් බලපත්‍ර ලබානොගත් වාහනවල ලියාපදිංචිය අවලංගු වන බව දැන්වීම හේතුවෙන් දඩ මුදල් ගෙවා ආදායම් බලපත්‍ර ලබාගතිමි. |

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුළදී සංවර්ධන ව්‍යාපෘතීන් 16 ක් සඳහා රු.2,115,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණද එම ව්‍යාපෘති ඉටුකර නොතිබුණි. | ව්‍යාපෘති අප්‍රමාදව ක්‍රියාත්මක කළ යුතුය. | ඇතැම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කාලය ප්‍රමාණවත් නොවූ නිසා කිසිදු කොන්ත්‍රාත්කරුවෙකු ඉදිරිපත් නොවූ අතර විවිධ හේතූන් මත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. |

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1. අයවැය පාලනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත වියදම ඉක්මවා පැවති වියදම් විෂයයන් 5 ක් සඳහා ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 14 අනුව පරිපූරක වියදම් ඇස්තමේන්තු අනුමත කරගැනීමට කටයුතු කර නොතිබුණි. | ඇස්තමේන්තුගත වියදම් ඉක්මවීමේදී රීති අනුව පරිපූරක වියදම් ඇස්තමේන්තු අනුමත කරගත යුතුවේ. | පරිපූරක වියදම් ඇස්තමේන්තු සකස් නොකර වැය ලෙජර් මාරුකර ගෙවීම් කටයුතු සිදුකර ඇත. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති 193 අනුව අයවැයගත මූල්‍ය ප්‍රතිපාදන සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර සිදු වී තිබෙන වෙනස්වීම් පිළිබඳව කරුණු පැහැදිලි කිරීමේ ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. | අදාළ රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂය අවසානයේදී මේ සම්බන්ධයෙන් අවධානය යොමුකර කටයුතු කරමි. |